

# ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳව උපදේශ ලබා දෙන්න

මෙය ඔබ තනියම කිරීමට අවශ්‍ය නැත. ඔවුන්ට උදවු කිරීමට අවශ්‍ය උදවු උපදේශන මඟින් සලසා ගත හැක.

ඔබගේ කොට්ඨාශයේ හෝ ශාඛාවේ තනි පුද්ගලයෙකුට හෝ පවුලකට ඔවුන්ගේ අවශ්‍යතාවන්ට අනුව දේවසේවයේ යෙදීමට දෙවියන්වහන්සේ ඔබට අරාධනා කර ඇත. එම අවශ්‍යතාවන් මොනවාද යන්න ඔබ සොයාගන්නේ කෙසේද? සහාව තුල වැඩි අවධානයට පත්ව ඇති, උපදේශන ලබා දීමේ මූලධර්මය එයට යතුර වේ.

උපදේශන ලබා දිය යුත්තේ මොනවා පිළිබඳවද යන්න සලකා බලා සාකච්ඡා කල පසු, අපට සොයා ගත බැලිය යුතුවන්නේ:

1. දෙව්පියාණන් සමඟ උපදේශන පැවැත්වීම.
2. පැවරූ පුද්ගලයා හෝ පවුල සමඟ උපදේශන පැවැත්වීම.
3. අපගේ සහයකයා සමඟ උපදේශන පැවැත්වීම.
4. සහ එම පුද්ගලයා හෝ පවුල පවරා දී ඇති අනෙකුත් අය සමඟ උපදේශන පැවැත්වීම.

අපගේ නායකයන් සමඟ උපදේශන පැවැත්වීමද අත්‍යවශ්‍ය වේ. ලියහෝනාවෙහි ඉදිරි දේවසේවා මූලධර්ම ලිපි නායකයන් සමඟ උපදේශන පැවැත්වීම මෙන්ම එම ක්‍රියාවලියේ දේවසේවා සම්මු ඛ සාකච්ජා වල ක්‍රියාකලාපය පිළිබඳව සොයා බලනු ඇත.

### අපි උපදේශන පවත්වන්නේ කුමක් ගැනද

එකිනෙකාට දේවසේවයේ යෙදීමේදී අවශ්‍යතාවන් තේරුම්ගැනීම අත්‍යවශ්‍ය වේ. නමුත් එම අවශ්‍යතාවන් කුමන ආකාරයෙන් විය යුතුද, සහ අවශ්‍යතාවන්ට වඩා වැඩි යමක් අපි සොයාගත යුතුද?

අවශ්‍යතාවන් විවිධ ආකාරෙයෙන් පැමිණේ. අප සේවය කරන අය චිත්තවේගී, මූල්‍යමය, ශාරීරික, අධ්‍යාපනික සහ වෙනත් බොහෝ ආකාර වල අභියෝග වලට මුහුණ පෑ හැකිය. සමහර අවශ්‍යතාවන් අනිත් ජීවාට වඩා වැඩි ප්‍රමුඛතාවකින් යුතුවිය හැක. සමහර අවශ්‍යතා වලට උදවු කිරීමට අපට මෙවලමක් විය හැක; අනෙකුත් අවශ්‍යතාවන් සඳහා අපි අපිටම උදවු කර ගැනීමට අවශ්‍ය වේ. අනිකුත් තාවකාලික අවශ්‍යතාවන් සපුරාදීමට අපි කරන උත්සාහයේදී, දේවසේවයේ යෙදීමට අපට ඇති කැඳවීම ගිවිසුම් මාර්ගයේ ඉදිරියට යාමට අනිත් අයට උදවු කිරීම, උත්කර්ෂය සඳහා අත්‍යවශ්‍ය පූජකත්ව වත්පිළිවෙත් සඳහා සූදානම් කිරීම සහ ලබාගැනීමද ඇතුලත් බව අමතක නොකරන්න.

තනි පුද්ගලයෙකුගේ හෝ පවුලක අවශ්‍යතා පිළිබඳව උපදේශන පවත්වනවාට අමතරව, අපි ඔවුන්ගේ පුළුවන්කම ගැන දැනගැනීමට උත්සහ කල යුතුය. ඔවුන්ට උදවු අවශ්‍ය නොවන්නේ කුමක් සඳහාද? අනිත් අයට ආශිර්වාදයක් වීම සඳහා ඔවුන් තුල ඇති හැකියාවන් සහ තලෙන්ත මොනවාද? දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට උදවු වීම සඳහා ඔවුන් අද්විතීය ලෙස ගැලපෙන්නේ කෙසේද? ඔහුගේ හෝ ඇයගේ අවශ්‍යතාවය තරමම පුද්ගලයෙකුගේ හැකියාවන් පිළිබඳවද තෙරුම්ගැනීම ඉතා වැදගත් වේ.

### දෙවියන්වහන්සේ සමඟ උපදේශන පැවැත්වීම

අපගේ ඇදහිල්ලේ එක ප්‍රමුඛ මතයක් වන්නේ ස්වර්ගික පියාණන්වහන්සේ උන්වහන්සේගේ දරුවන්ට කතාකරන බවයි (see Articles of Faith 1:9). කෙනෙකු හට දේවසේවයේ යෙදීමට අලුතින් පැවරුමක් අපිට ලැබුණු විට, ඔවුන්ගේ අවශ්‍යතා සහ හැකියාවන් ගැන

ප්‍රඥාව සහ තේරුම්ගැනීම ලැබෙනු පිණිස, යාච්ඤාව තුලින් ස්වර්ගික පියාණන් සමඟ උපදේශන පැවැත්විය යුතුය. යාච්ඤාව තුලින් උපදේශන පැවැත්වීමේ ක්‍රියාවලිය අපගේ මුළු දේවසේවා පැවරුම මුළුල්ලේ දිගටම පැවැත්විය යුතුය.

පුද්ගලයන් සහ පවුල් සමඟ උපදේශ පැවැත්වීම

සේවය කිරීමට අපව කැඳවූ පුද්ගලයන් හෝ පවුල් වලට ප්‍රවේශ වන්නේ කොහොමද සහ කවදාද යන්න රඳාපවතින තත්වයන් මත වෙනස් වේ, නමුත් පුද්ගලයා හෝ පවුල සමඟ කෙලින් උපදේශ පැවැත්වීම සම්බන්ධතා ගොඩනැගීමට සහ ඔවුන්ගේ අවශ්‍යතාවන් තේරුම්ගැනීමට අවශ්‍ය වේ, ඔවුන්ට උදවු අවශ්‍ය වන්නේ කෙසේද යන්නද ඇතුළුව. අර්ථවත් සම්බන්ධතාවක් වර්ධනය වනතුරු සමහර ප්‍රශ්න වලට රැඳීසිටීමට සිදුවෙයි. එය කිරීමට එක් හරි දෙයක් නොමැති හෙයින්, පහත සඳහන් දේවල් සලකා බලන්න:

- ඔවුන්ව කෙසේ සහ කවදා සම්බන්ධ කරගන්නවාට වඩාත් කැමතිද යන්න සොයා බලන්න.
- ඔවුන් කැමති දේවල් සහ පසුබිම ගැන ඉගෙනගන්න.
- ඔබ ඔවුන්ට උදවු කල හැකි ක්‍රම යෝජනා කර සහ ඔවුන්ගේ යෝජනා වලටද ඇහුම්කන් දෙන්න.

අපි විශ්වාසය ගොඩනගන ලෙස, පුද්ගලයාගේ හෝ පවුලේ අවශ්‍යතා පිළිබඳව සාකච්ඡා කිරීමට සලකා බලන්න. ශුධාත්මයාණන්වහන්සේගේ පෙළඹවීම් වලට අනුව ප්‍රශ්න අසන්න. උදාහරණ ලෙස:

- ඔවුන් මුහුණපාන අභියෝග මොනවාද?
- ඔවුන්ගේ පවුල් සහ පුද්ගලයන් වශයෙන් ඇති අරමුණු මොනවාද? උදාහරණයක් වශයෙන්, ඔවුන්ට වඩාත් හොඳින් කිරීමට උවමනා ක්‍රමවත් පවුල් සැන්දෑ පැවැත්වීමටද, නැතිනම් තව තවත් ස්වාධීන වීමටද?
- අපි කොහොමද ඔවුන්ගේ අරමුණු සහ අභියෝග වලට උදවු වෙන්නේ?
- සුභාරංචියේ කුමන වත්පිළිවෙත ඉදිරියේදී ඔවුන්ගේ ජීවිතයේ සිදුවීමට තිබෙනවාද? එයට සූදානම් වීමට ඔවුන්ට අපි කෙසේ උදවු කල හැකිද?

"මෙම සතියේ කවදා ඔබට රාත්‍රී ආහාර ගෙන ඒමට අපිට පුලුවන්ද? වැනි නිශ්චිත උදවු පිරිනැමීමට මතක තබාගන්න. "අපිට කල හැකි යමක් තිබෙනවානම් දන්වන්න" වැනි නොපැහැදිලි ඉදිරිපත්වීම් වඩාත් උපකාරී නොවේ.

අපගේ සහයකයා සමඟ උපදේශන පැවැත්වීම

ඔබ එම පුද්ගලයා සමඟ හෝ පවුල සමඟ කටයුතු කරන විට ඔබට සහ ඔබේ සහායකයාට සැමවිටම එකට සිටිය නොහැකි නිසා, සහායකයන් ලෙස ඥාණය සොයන විට සම්බන්ධීකරණය සහ උපදේශන පැවැත්වීම ඉතා වැදගත් වේ. සලකා බැලිය හැකි ප්‍රශ්න කිහිපයක් මෙන්න:

- සහායකයන් ලෙස කෙසේ සහ කොපමන වාරයක් ඔබ එකිනෙකා සමඟ කතාබහ කරනවාද?
- පවුලේ හෝ පුද්ගලයාගේ අවශ්‍යතාවන්ට අනුව දේවසේවයේ යෙදීමේදී ඔබට එකිනෙකාගේ හැකියාවන් කෙසේ භාවිතා කල හැකිද?
- තනි පුද්ගලයා පිළිබඳව හෝ පවුල පිළිබඳව අවසාන වරට කතාබහ කල කාලයේ සිට ඔබ ඉගෙනගෙන තිබෙන දේවල් මොනවාද, ඔබ ලබා ඇති අත්දැකීම් මොනවාද, සහ ඔබ ලබා ඇති අනුභස් මොනවාද?

පත්කර ඇති අනිත් අය සමඟ උපදේශන පැවැත්වීම

ඔබට පවරා ඇති එම පුද්ගලයාම හෝ පවුලම වෙනුවෙන් දේවසේවයේ යෙදීමට පවරා ඇති අනිත් අය සමඟ කාලයෙන් කාලයට කතාබහ කිරීම වැදගත් වේ.

අභියෝග විසඳීමට සන්නිවේදනය කරන්න

හැත්තෑවරුන්ගේ වැඩිහිටි වී. හොංග් (සැම්) වොන්ග් මාක් 2 සඳහන් කතන්දරයක් අපගේ වර්තමාන කාලයට ආදර්ශ කර ඇත්තේ එකට උපදේශ පැවැත්වීම තුලින් මිනිසුන් හතර දෙනෙකුට අංශභාගී රෝගියෙකු යේසුස්වහන්සේ සිටි ස්ථානයට ගෙන යාමට හැකිවීම විදහා පෑමටයි.

"එය මෙසේ සිදුවිය හැක" වැඩිහිටි වොන්ග් පැවසීය. "ඔවුන්ගේ සභා නායකයාගෙන් ලැබුණු කැඳවීමක් ඉටුකිරීමට පුද්ගලයන් හතර දෙනෙක් අංශභාගී රෝගියෙකු බැහැදැකීමට ඔහුගේ නිවසට ගියහ. ...මෑතකදී පැවති කොට්ඨාශ සම්මන්ත්‍රණ සභාවකදී, කොට්ටාශයේ අවශ්‍යතාවන් පිළිබඳව උපදේශ පැවැත්වීමෙන් පසුව, "බේරාගැනීමේ" පැවරුම් සභානායකයා විසින් පවරා දෙන ලදී. මෙම හතර දෙනාට එම අංශභාගී පුද්ගලයා හට උදවු කිරීමට පැවරුණි. ...

"[ක්‍රිස්තුස්වහන්සේ සිටි ගොඩනැගිල්ල වෙතට ඔවුන් පැමිණි විට,] මුළු කාමරයම මිනිසුන්ගෙන් පිරී තිබුණි. ඔවුන්ට දොරෙන් ඇතුළු වීමට පුළුවන් කමක් තුබුණේ නැත. මට විශ්වාසයි ඔවුන්ට පුලුවන් හැම දෙයක්ම ඔවුන් උත්සහ කර බලන්න ඇති කියලා, නමුත් ඔවුන්ට ඇතුල්වීමට නොහැකි වුනා. ... ඊළඟට කරන්නේ කුමක්ද කියලා ඔවුන් උපදේශන පැවැත්වුවා - සුවය ලැබීම පිණිස එම මනුෂ්‍යයාව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ළඟට ගෙන එන්නේ කොහොමද . ... ඔවුන් සැලැස්මක් සැලසුම් කළා - එය පහසු එකක් නොවේ, නමුත් ඔවුන් ඒ තුල ක්‍රියා කළා.

"... උන්වහන්සේ සිටි තැන වහලය ඔවුන් විවර කළා: ඔවුන් එය පළුඳු කරායින් පසු, අංශභාගී රෝගියා වැතිර සිටි ඇඳ වහලයෙන් බිමට බැස්සවීය' (මාක් 2:4). ...

"... 'යේසුස්වහන්සේ ඔවුන්ගේ විශ්වාසය දුටු විට, අංශභාගී රෝගියාට උන්වහන්සේ මෙසේ කීහ, පුත්‍රයා, ඔබේ පවු කමා කරන ලදී' (මාක් 2:5)."

ක්‍රියා කිරීමට ආරාධනාව

අපොස්තුලුවරු දොළොස්දෙනාගේ සනපූර්ණයේ වැඩිහිටි ඩියේටර් එෆ්. උච්ඩ්රොෆ් මෙසේ උනන්දු කරනවා, "එකට උපදේශන පවත්වන්න, තිබෙන සෑම සම්පතක්ම භාවිතා කරන්න, ශුධාත්මයාණන්වහන්සේගේ ඥාණය සොයන්න,

ස්වාමින්වහන්සේගෙන් උන්වහන්සේගේ ස්ථිර කිරීම ඉල්ලා සිටින්න, සහ ඔබ හොඳින් සූදානම් වී කටයුතු කරන්න.

“මම ඔබට පොරොන්දු වෙනවා: ඔබ මෙම රටාව අනුගමනය කළහොත්, ස්වාමින්වහන්සේගේ මාර්ගය සැපයීමට කවුද, මොනවාද, කවදාද, සහ කොහෙද යන්නට ඔබට නිශ්චිත මගපෙන්වීම් ලැබේවි.

[redacted]

“දේවසේවා මූලධර්ම” ලිපි වල චේතනාව වන්නේ එකිනෙකා ගැන සැලකිලිමත් වීමට ඉගනගැනීමට අපට උදවු කිරීම මිස - දේවසේවා බැහැදැකීම් වලදී බෙදාගැනීම නොවේ. අපි සේවය කරන අය ගැන දැනගත් පසු, අපේ සැලකිල්ල සහ දයානුකම්පාවට අමතරව ඔවුන්ට අවශ්‍ය කුමන පණිවිඩයද යන්න දැනගැනීමට ශුද්ධාත්මයාණන්වහන්සේ අපට සිහි කරන සේක.උපදේශන පැවත්වීමේ බලය

“If you want to improve something, you’ve got to counsel about it,” said President M. Russell Ballard, Acting President of the Quorum of the Twelve Apostles. “When we [do], we create spiritual synergism which is increased effectiveness or achievement as a result of combined action or cooperation, the result of which is greater than the sum of the individual parts” (in R. Scott Lloyd, “Counseling with Councils Is Lord’s System, Elder Ballard Declares,” Jan. 11, 2017, ; “Strength in Counsel,” Ensign, Nov. 1993, 77).

[redacted]

Building relationships is also an important part of counseling together. See also the Ministering Principles article “Building Meaningful Relationships,” in the August 2018 issue of the *Liahona,* on page 6.

සටහන්


1. See *Preach My Gospel: A Guide to Missionary Service* (2004), 183.
2. Chi Hong (Sam) Wong, “Rescue in Unity,” *Liahona,* Nov. 2014, 14–15.
3. Dieter F. Uchtdorf, “Providing in the Lord’s Way,” *Liahona,* Nov. 2011, 55.


© 2018 by All rights reserved. Printed in USA. English approval: 6/17. Translation approval: 6/17. Translation of *Ministering Principles, September 2018.* Sinhala. 15052 408